


අමීරේ අහ්ලුස්සුන්නත්, අබු බිලාල් හස්රත් අල්ලාමා මෝලානා

මුහම්මද් ඉල්යාස් අත්තාර් (කාදිරි, රැසවි)

(دامت برکاتہم العالیہ)


තුමාණන් විසින් උර්දු භාෂාවෙන් රචිත ග්‍රන්ථයේ සිංහල පරිවර්තනය

# වසන්තයේ අරුණෝදය

නායකයාණන්ගේ සම්ප්‍රාප්තියෙන් අඳුරු යුගය නිමා වුණි.
අහසත් පොළවත් සැම තැන ආලෝකයෙන් දිලිසුණි.


උර්දු භාෂාවෙන් සම්පාදනය

අත්තාර් ගේ පුතණුවන්

හාජි අහ්මද් රැසා (අත්තාරි)



ෆයිසානේ මදීනා

නො. 10, මැසෙන්ජර් වීදිය, කොළඹ - 12

දුරකථනය : (011) 2394748/9

Email : maktaba@dawateislami.net

Website : www.dawateislami.net

අමීරේ අහ්ලුස්සුන්නත්, අබූ බිලාල් හස්රත් අල්ලාමා මෞලානා

**මුහම්මද් ඉල්යාස් අත්තාර් (කාදිරී, රzවී)**
(دامت برکاتہم العالیہ)

තුමාණන් විසින් උර්දු භාෂාවෙන් රචිත ග්‍රන්ථයේ සිංහල පරිවර්තනය

# වසන්තයේ අරුණෝදය

නායකයාණන්ගේ සම්ප්‍රාප්තියෙන් අඳුරු යුගය නිමා වුණි.
අහසත් පොළවත් සැම තැන ආලෝකයෙන් දිලිසුණි.

උර්දු භාෂාවෙන් සම්පාදනය
අත්තාර් ගේ පුතණුවන්
**හාජී අහ්මද් රzසා (අත්තාරී)**

**ෆයිසානේ මදීනා**
නො. 10, මැසැන්ජර් වීදිය, කොළඹ - 12
දුරකථනය : (011) 2394748/9
Email : maktaba@dawateislami.net
Website : www.dawateislami.net

# පටුන


සලවාතයේ මහිමය .............. 01

වසන්තයේ අරුණෝදය .............. 02

මුංපිසාත් (පුදුමයන්) .............. 03

ලයිලතුල් කද්ර් රාත්‍රියට වඩා ශ්‍රේෂ්ඨ රාත්‍රිය .............. 04

අවුරුද්දකටත් වැඩිය උතුම් අවුරුද්දක් .............. 04

අබුලහබ් හා මීලාද් .............. 05

මුස්ලිම් වරුන් හා මීලාද් .............. 05

මීලාද් උත්සවය සමරන්න .............. 06

මීලාද් උත්සව සැමරීමෙන්
صَلَّى اللهُ تعالى عليه وآله وسلّم තුමාණන් සතුටු වන්නේය........ 06

මීලාද් (විලාදත්) සතුටින් කොඩි .............. 07

කොඩි වනමින් පෙළපාලි .............. 07

ඊමානය ආරක්ෂා කර ගැනීමට ක්‍රමයක් .............. 08

ඊමාන ස්වර්ගත්වයට පත් කරන සිද්ධියක් .............. 08

මීලාද් උත්සව සැමරීමේ සවාබ් .............. 11

ජන්ම දිනයේ පිහිටෙන් යුදෙව්වන්ට
ඊමානයේ භාග්‍ය ලැබුණි .............. 12

මර්හබා යා මුස්තෆා යන උරුදු (අරාබි)
වාක්‍යයේ ඇති අක්ෂර 12 ට සරිලන පරිදි
මදනි පුෂ්පයන් 12 .............. 14

ජන්ම දින උත්සව සැමරීමේ ක්‍රම .............. 17

( اَلْحَمْدُ لِلّٰہِ رَبِّ الْعٰلَمِیْنَ وَالصَّلٰوۃُ وَالسَّلَامُ عَلٰی سَیِّدِ الْمُرْسَلِیْنَ

اَمَّا بَعْدُ فَاَعُوْذُ بِاللّٰہِ مِنَ الشَّیْطٰنِ الرَّجِیْمِ ط بِسْمِ اللّٰہِ الرَّحْمٰنِ الرَّحِیْمِ ط )

# වසන්තයේ අරුණෝදය

මිලාදුන් නබී صَلَّی اللّٰہُ تعالٰی علیہ واٰلہ وسلّم උත්සවයට සුභ පැතුම්

## සලවාතයේ මහිමය

යම් කෙනෙක් මාගේ නාමයෙන් 10 වරක් සලවාතය උසුරෙන්නේද අල්ලාහ් තආලා ඔහු වෙනුවෙන් රහ්මතයන් 100ක් පහළ කරන්නේය. (අත් තර්ගිබ් වත්තර් හිබ් පි 2 පි.322)

صَلُّوا عَلَی الْحَبِیْب صَلَّی اللّٰہُ تعالٰی علی محمّد

භාග්‍යවන්ත මාසය රබීයන්නූර් (රබියුල් අව්වල්) මාසය සෑම පැත්තකින්ම වසන්තය උදා කරමින් පැමිණෙන්නේය. අති උත්තම නබි صَلَّی اللّٰہُ تعالٰی علیہ واٰلہ وسلّم තුමාණන්ගේ ස්නේහවන්තයන් සතුටින් ඉපිලී යන්නෝය. බාල මහළු සියලු සත්‍ය මුස්ලිම්වරුන්ගේ දිවෙන් මෙසේ පිට වන්නේය.

ඔබේ අවුරුදු දින දාහක ප්‍රීතියට වඩා
රබියියුල් අව්වල් එකක් සුවිශේෂයි.
මුළු ලොවම ප්‍රීතිවන අවස්ථාවේ
ඉබ්ලීස් පමණක් දුකින් සිටියි

මුළු ලොවම කුෆරය නැමැති අඳුරේ ගිලී පිළිම වන්දනා, කෲරකමින්, පාලනයකින් තොරව පැවැති ජාහිලියියා සමයේ ඉතාමත් දුක්ඛිත තත්වයක පත් වී සිටි මොහොතක මක්කානම් නගරයේ රබියියුල් අව්වල් මාසයේ 12 වන දිනයේ සෙයිදුතුනා ආමිනා رضي الله تعالى عنها තුමියගේ නිවසේ දෙලොවම දීප්තිමත් කරන ආලෝකය උදාවිය. එම ආලෝකය නම් මුළු ලොවම බලාපොරොත්තුවෙන් සිටි උත්තම සත් පුරුෂ නබි නායක صلى الله تعالى عليه وآله وسلم තුමාණන් මුළු ලොවටම කරුණා දයාවත් පතුරවමින් අඳුරු යුගය අවසන් කරමින් නව ආලෝකයක් ඇති කරමින් උපත ලැබූහ.

ඛාතමුල් මුර්සලීන්ගේ සම්ප්‍රාප්තියට සුභ පැතුම්!
රහ්මතුල් ලිල් ආලමීන්ගේ සම්ප්‍රාප්තියට සුභ පැතුම්!

## වසන්තයේ අරුණෝදය

නබිවරුන්ගෙන් අවසන් නබි වූද, දෙලොවටම කරුණාවන්ත වූද, පාපීන් වෙනුවෙන් අනුකම්පා කරන්නා වූද, දුගින්ට පිහිට වන්නාවූද, රබ්බුල් ආලමීන්ගේ විශේෂ ස්නේහයට ප්‍රාප්ත වූද, සත්‍ය මග පෙන්වන්නා වූද, අති උත්තම නබි නායක صلى الله تعالى عليه وآله وسلم තුමාණන් රබියුල් අව්වල් (රබියියුන් නූර්) මාසයේ 12 වැනිදා හිමිදිරියේ මෙලොව උපත ලැබූහ. එසේ පැමිණ, අයුක්තියට, අසාධාරණයට, ලක්වූවන් පීඩා විඳින්නන් යනාදි සියලූ දෙනාටම වසන්තයේ අරුණෝදය ඇති කළහ.

මුස්ලිම්වරුණි! වසන්තයේ අරුණෝදයට සුභ පැතුම්!
එය අප නායකයාණන්ගේ ආලෝකය නම් වලාවයි.

# මු:ජ සාත් (පුදුමයන්)

රබ්යියුන් නූර් 12 වැනි දිනයේ අල්ලාහ් عزوجل ගේ ශුද්ධ ආලෝකය වූ صَلَّى اللهُ تعالٰی علیه وآله وسلّم තුමානන්ගේ උපත සමඟ කෆිර් වරුන්ගේ වැරදි ඇදහිලි සියල්ල වසාගෙන සිටි වළාකුළු තුරන් විය. ඉරානයේ මහරජු කිස්රාගේ මාළිගාවට භූමිකම්පාවක් ඇති විය. සතර වළල්ල ඇද වැටිණි. වසර 1000ක නොනිවී දැල් වෙමින් තිබූ ඉරානයේ ගිනිමැළඳ නිවිණි. සාවා නැමැති ගඟද සිඳී ගියේය. කඃබාවටත් ප්‍රාණය ලැබිණි. එහි තිබූ පිළිමයන් සියල්ල මුනින් අතට ඇද වැටිනි.

ඔබගේ පැමිණීමට බයිතුල්ලාහ් හිස නැමුවා
ඔබගේ තේජසට සියලු පිළිම ඇද වැටුණා

තාජ්දාරේ රිසාලත් صَلَّى اللهُ تعالٰی علیه وآله وسـلّم

තුමාණන්ගේ මෙලොවට සම්ප්‍රාප්ත වීම සත්‍ය වශයෙන් අල්ලාහ් عزوجل ගේ රහ්මතය (කරුණාව) පහළ වීමකි. එදින ප්‍රීති වී සතුටු වී සිටිය යුතු දිනයකි. එම නිසාම අල්ලාහ් තආලා මෙසේ පවසන්නේය.

قُلْ بِفَضْلِ اللهِ وَبِرَحْمَتِهٖ فَبِذٰلِكَ فَلْيَفْرَحُوْا ؕ هُوَ خَيْرٌ مِّمَّا يَجْمَعُوْنَ

තේරුම කල්සුල් ඊමාන්:- අල්ලාහ් තආලාගේ වරප්‍රසාදයෙහි ද ඔහුගේ දයාවෙහිද ඔවුහු ප්‍රමුදිතවෙත්වා! ඔවුන් රැස් කරනදෙයට වඩා එය හොඳයි අල්ලාහු අක්බර්!

අල්ලාහ්ගේ රහ්මතයන්ට ප්‍රීතිවන ලෙස අල්ලාහ් තආලා අල්කුර්ආනයේ අණ කර සිටියි. එසේ නම් අප නබි

නායක صَلَّى اللهُ تعالى عليه واٰله وسلّم තුමාණන්ටත් වඩා අල්ලාහ් තආලාගේ රහ්මතයක් අපට තිබේද? බලන්න අල්කුර්ආනයේ ඉතාමත් පැහැදිලිව ඒ පිළිබඳව පවසා ඇත.

وَمَآ اَرْسَلْنٰكَ اِلَّا رَحْمَةً لِّلْعٰلَمِيْنَ

තේරුම කන්සුල් ඊමාන්:- මුළු ලොවටම දයාලු බවක් ලෙස මිස අපි ඔබව නොඑව්වෙමු!

## ලයිලතුල් කද්ර් රාත්‍රියට වඩා ශ්‍රේෂ්ඨ රාත්‍රිය

හස්රත් සෙයිදුනා ෂෙයික් අබ්දුල් හක් මුහද්දිස් දෙහ්ලවි عليه رَحْمَةُ اللهِ القوى තුමාණන් පවසා සිටින්නේ සත්‍ය වශයෙන්ම සර්වරේ ආලම් صَلَّى اللهُ تعالى عليه واٰله وسلّم තුමාණන් උපන් දින රාත්‍රිය ලයිල තුල් කද්ර් රාත්‍රියට වඩා උතුම් රාත්‍රියයි. එම රාත්‍රිය එතුමාණන්ට ලබාදුන් උතුම් රාත්‍රියයි. එසේ නම් එය ලබා ගන්නා කෙතරම් ශ්‍රේෂ්ඨ විය යුතුද. එතුමාණන් ඉපදුනු රාත්‍රිය කෙතරම් ගෞරවනීය විය යුතුද? එම රාත්‍රියේ මළාඉකා වරුන්ද අධික ලෙස පහළ වූහ.

## අවුරුද්දකටත් වැඩිය උතුම් අවුරුද්දක්

අල්හම්දුලිල්ලාහ් عزوجلّ රබියියන්නූර් 12 වැනි දිනය මුස්ලිම් වරයෙකුට අවුරුදු දවසටත් වඩා උතුම් වූ ප්‍රීතිමත් දවසකි. අප උත්තම නායකයාණන් නැත්නම්, අවුරුදු නොමැත, එසේ නම් ලයිලතුල් කද්ර් නොමැත. මෙලොවත් නොමැත. කිසිවක් නොමැත. මේ සියලු සම්පත් අප උතුම් නායක صَلَّى اللهُ تعالى عليه واٰله وسلّم තුමාණන්ගේ පිහිටෙන් ලැබූ දේවල්ය.

"ඔහු නැති කළ කිසිවක් නොතිබුණි. ඔහු නැත්නම් කිසිවක් නොමැත. මුළු ලොවටම ප්‍රාණය ඔහුය. ඔහුගේ ප්‍රාණය මුළු ලොවමයි."

## අබුලහබ් හා මීලාද්

අබුලහබ් මිය ගිය පසු ඔහුගේ නිවෙසියන් ඔහුව සිහිනෙන් දැක ඔබට කුමක් වුවාදැයි විමසා සිටියහ. එවිට පිළිතුර ලෙස ඔබලාගෙන් වෙන් වීමෙන් පසු මට කිසිම සෙතක් නම් සිදුවුයේ නැත. නමුත් (සංඥාකර) මෙම සුළගිල්ලෙන් පමණක් වතුර බීමට ලැබෙන්නේය. එයත් එම ඇගිල්ලෙන් සංඥාකර සව්බියා (තම සේවිකාව) නිදහස් කිරීම නිසා යැයි පැවසුවේය. (බුහාරි ජි. 1 පි. 153 හදීස් නො. 5101 කිතාබුන් නිකාහ් බාබු උම්ම හාතුකුමුල්ලාති අර්ලංනකුම් දාරුල් ෆික්ර් බේරූක්.

## මුස්ලිම් වරුන් හා මීලාද්

මෙම රිවායතය ගෙන සෙයිදුනා ෂෙයික් අබ්දුල් හක් මුහද්දිස් දහ්ලවි عليه رحمة الله القوى තුමාණන් පවසා සිටින්නේ මීලාද් ෂරීෆ් උත්සව සිරියෙන් ප්‍රිතිමත් වන්නන්ට කදිම උදාහරණයකි. එනම් තාජිදාරේ මදීනා صلى الله تعالى عليه وآله وسلم තුමාණන්ගේ සම්ප්‍රාප්තිය වෙනුවෙන් ප්‍රිතියට පත් අබුලහබ් තම සේවිකාව නිදහස් කිරීම නිසා මෙතරම් නම් එතුමාණන්ගේ උපතට සතුටු වී ප්‍රිතියෙන් උත්සව සමරන මුස්ලිම්වරුන්ට ඒ සඳහා කොතරම් සහනයක් ලැබිය හැකිද? (මදාරිජුන් නුබුව්වත් ජි 2 පි 34 ඩියා උල් කුර්ආන්)

# මීලාද් උත්සවය සමරන්න

හිතාදර ඉස්ලාමීය සහෝදරවරුණි!

ඔබත් හැකි තරමින් මීලාද් උත්සවය සමරන්න. අබුලහබ් වැනි කාෆිර් වරයෙකුට මෙතරම් ප්‍රයෝජනයක් ඇත්නම් අප වැනි මුස්ලිම්වරුන්ට කොතරම් ප්‍රයෝජනයක් සිදුවිය හැකිද? සිතා බලන්න. අබුලහබ් අල්ලාහ් තආලාගේ රසූල් صَلَّى اللّٰهُ تعالى عليه وآله وسلَّم ගැන සිතා නොව තම මළනුවන්ගේ පුත්‍රයාණන් ගැන සිතා ප්‍රීතියට පත් වී කළ එම සත් කාර්යයට මෙසේ නම් අප අල්ලාහ් තආලාගේ මහ්බූබ් صَلَّى اللّٰهُ تعالى عليه وآله وسلَّم තුමාණන් ගැන සිතා ප්‍රීතිමත් වී කරන යහ ක්‍රියාවන්ට කොතරම් ප්‍රතිඵල ලැබිය හැකිද?

"ආමිනාගේ නිවසට සත්‍ය පැමිණියා
පීඩිතයනි සතුටුවෙන්න සනසන්නා පැමිණියා"

## මීලාද් උත්සව සැමරීමෙන් صَلَّى اللّٰهُ تعالى عليه وآله وسلَّم තුමාණන් සතුටු වන්නේය.

එක් ආලිම් සාහිබ් رحمة الله تعالى عليه වරයෙකු සිහිනෙන් රසූල් صَلَّى اللّٰهُ تعالى عليه وآله وسلَّم තුමාණන්ව දැක යාරසූලුල්ලාහ් صَلَّى اللّٰهُ تعالى عليه وآله وسلَّم සෑම වසරකම මුස්ලිම් වරුන්ගේ මීලාද් සමරති. ඔබ තුමාණන් එයට එකඟද? එයින් සතුටු වන්නේද? කියා විමසීය. එවිට පිළිතුර ලෙස යම් කෙනෙක් අප සමඟ සතුටු වන්නේද අපත් ඔහු සමඟ සතුටු වන්නේය යනුවෙන් පැවසූහ. (තස්කිරතුල් වාඉලීන් පි. 600)

## මීලාද් (විලාදත්) සතුටින් කොඩි

සෙයිඳතුනා ආමිනා رضی اللّٰہ تعالٰی عنہا තුමිය මෙසේ පවසා සිටින්නිය. එනම්, ධජයන් (කොඩි) තුනක් සිටවනු දුටුවෙමි. එක් ධජයක් (කොඩියක්) නැගෙනහිරත් එක් ධජයක් (කොඩියක්) බටහිරත් තවත් ධජයක් (කොඩියක්) කඃබතුල්ලාවෙත් සිටවනු දුටු අතර එම අවස්ථාවේම صلّی اللّٰہ تعالٰی علیہ وآلہ وسلّم තුමාණන්ද උපත ලැබූහ. (හසාඉසුල් කුබ්රා පි 1 පි. 86 දාරුල් කුතුබුල් ඉල්මියියාහ් බේරූත්)

"රූහුල් අමීන් කඃබාවේ වහලය මත කොඩියක් සිටවූවා එසැනින් අර්ෂය දක්වා ජන්ම වසන්තය උදාවූවා."

## කොඩි වනමින් පෙළපාලි

රහ්මතුල්ලිල් ආලමීන් صلّی اللّٰہ تعالٰی علیہ وآلہ وسلّم තුමාණන් මක්කාවෙන් හිජ්රත් කර මදීනාව කර පැමිණෙමින් හම්මී නැමැති ගම්මානයට ඇතුළු වූ විට බරීදා අස්ලමී යන තැනැත්තා බනී සහම් ගෝත්‍රයේ 70 දෙනෙකුගෙන් යුතු හට කාණ්ඩයක් සමඟ සර්කාරේ නාමදාර් صلّی اللّٰہ تعالٰی علیہ وآلہ وسلّم තුමාණන්ව අත් අඩංගුවට ගැනීම පැමිණියේය. නමුත් සර්කාරේ ආලම් صلّی اللّٰہ تعالٰی علیہ وآلہ وسلّم තුමාණන් ගේ කරුණා දයාව නිසාම එතුමාණන් ගෙන ආදර භක්තියක් ඇති වී සියලු දෙනා ඉස්ලාම් දහම වැළඳ ගත්තෝය. ඉන් පසු යාරසූලල්ලාහ් صلّی اللّٰہ تعالٰی علیہ وآلہ وسلّم මදීනා මුනාව්වරා වලට කොඩියක් සමඟ ඇතුළු විය යුතුයි පවසමින් තම ඉමාමා ෂරීපය

(තලප්පාව) ගලවා දුන්නක ගැට ගසා සර්කාරේ මදීනා صَلَّى اللّٰهُ تعالیٰ علیه واٰله وسلَّم තුමාණන්ට ඉදිරියෙන් ගමන් කරන්නට විය (වෆාඋල් වෆා ජි 1 පි 243)

## ඊමානය ආරක්ෂා කර ගැනීමට ක්‍රමයක්

ෂෙයිහුල් ඉස්ලාම් හස්රත් අල්ලාමා ඉබ්නු හජර් මක්කී علیه رَحْمَةُ اللّٰهِ القوی තුමාණන් اَلنِّعْمَةُ الْکُبریٰ ග්‍රන්ථයේ 24 වැනි පිටුවේ සඳහන් කරන්නේ. හසරත් සෙයිදුනා ජුනයිදුල් බග්දාදී علیه رحمة الهادی තුමාණන් මෙසේ පවසා ඇති බවයි. එනම් මීලාදේ මුස්තෆා صَلَّى اللّٰهُ تعالیٰ علیه واٰله وسلَّم (මීලාද් මජ්ලිස්) වලට ගෞරව සම්පන්නව සහභාගි වීම ඊමානය ආරක්ෂා කර ගැනීමට මගකි. اِنْ شَآءَ اللّٰه عَزَّوَجَلَّ

## ඊමාන ස්ථිරත්වයට පත් කරන සිද්ධියක්

මදීනා මුනව්වරා වල ඉබ්රාහිම් නැමැත්තකු අප නබි නායක صَلَّى اللّٰهُ تعالیٰ علیه واٰله وسلَّم තුමාණන් ගැන සිහි විකලෙන් මෙන් වශී වී සිටියේය. (එනම් එතරම් ආදර භක්තියකින්) ඔහු ගැන ප්‍රශංසා සියලු දෙස පැතිරී තිබුණි. ඔහු තමන් උපයන දෙයින් අඩක්ම මීලාද් සැමරීම සඳහා එකතු කරයි. ඔහු හලාල් වූ මාර්ගයෙන් පමණක් උපයා ගත්තේය. (ආහ්! අපිත් අපගේ උපයන මුදලින් කොටසක් වෙන් කර ගත්තානම්?) රබීයියුන් නූර් ෂර්ෆය උදා වූ විට ෂරීඅතයට අනුව ඉතාමත් උනන්දුවෙන් මීලාද් උත්සවය සැමරීම පුරුද්දක් කර ගෙන තිබිණි. ඒ සඳහා නිර්ලෝභීව වියදම් කරන්නේය. ඔහුගේ බිරිඳද එසේම

صلى الله تعالى عليه وآله وسلم තුමාණන් ගැන වශී වී සිටියාය. ඔහුගේ සියලු වැඩට උපකාර කරන්නිය. බිරිඳ වෆාත් වූ පසුද ඔහුගේ ක්‍රියාවේ වෙනසක් සිදු නොවීය. ඉබ්රාහිම් නැමැති ඔහු දිනක් තම තරුණ පුතුට මෙසේ වසියත් කිවේය. මගේ දයාබර පුතණුවනි! අද රාත්‍රියේ මාගේ මරණය සිදුවන්නේය. මා සන්තකයේම තිබෙන්නේ දිර්හම් 50ක් හා යාර 19ක් රෙදි පමණයි. රෙදි කැබැල්ල මාගේ කෆන් වලට පාවිච්චි කරන්න. දිර්හම් ටික හැකි නම් යහපත් දේවල් වලට වියදම් කරන්නැයි පවසා කලිමාව උසුරමින්ම වෆාත් විය.

පුත්‍රයාණන් ද පියාගේ අවසන් ඉල්ලීම පරිදි ජනාසා වැඩ කටයුතු හමාර කරත් දිර්හම් වලට කළ යුතු යහපත් ක්‍රියාව කුමක්දැයි සිතා ගත නොහැකි විය. එසේ සිතමින් සිට රාත්‍රියේ දී සිහිනෙන් කියාමත් දිනය දැක ගැනීමට ලැබුණි. එහි සෑම පැත්තකින්ම තම තමන් ගැන දුව පැනමින් සිටින්නන්, භාග්‍යවන්තයන් ප්‍රීතියෙන් ඉපිල්ලෙමි ස්වර්ගයට දුවමින් හා අභාග්‍යවන්තයන් නිරයට ඇදගෙන ගොස් දමමින් සිටියහ. ඒ සමඟ තමන් වෙව්ලමින් සිට ගෙන සිටින අතර තමන්ට කුමණ තීරණයක් ලැබිය හැකිදෝ කියා බිය වී සිටියේය. එවිටම නොපෙනෙන තැනකින් මොහුව ස්වර්ගයට යවන්නැයි හඬක් ඇසිනි. ඒ සමඟ ඔහු ස්වර්ගයට ඇතුළු වී සැරිසරන්නට විය ස්වර්ගයන් හතම සැරිසැරීමෙන් පසු අට වැනි ස්වර්ගයට ඇතුළු වීමට උත්සාහ කළ අවස්ථාවේ ස්වර්ගයට අධිපති රිල්වාන් අලෛහිස්සලාම් මෙසේ පැවසුහ. මෙයට ඇතුළු විය හැක්කේ රබියියුන්නුර් ෂරීෆයේ නබියේ කරීම් صلى الله تعالى عليه وآله وسلم තුමාණන්ගේ උපත සඳහා සතුට සමරන්නනටන්ට පමණි. එය ඇසීමෙන් මාගේ දෙමව්පියන් එහි සිටිය හැකි යැයි ඔහු සිතා ගත්තේය. එවිට ඇතුළතින් එම තරුණයාට ඇතුළු වීමට ඉඩ දෙන්න. ඔහුගේ දෙමාපියන් ඔහුව

බලා සිටින්නේය, යනුවෙන් හඬක් ඇසිණි. ඒ සමඟ ඔහුද ඇතුළු විය. එවිට තම මෑණියන් කව්සර් ජලාශය අසල සිටින අතර අසල එක් සිංහාසනය මත උතුම් කාන්තාවක් වාඩිවී සිටියාය. ඇය අසලින් සෑම පැත්තෙන්ම ආසනවල විශේෂිත කාන්තාවන් අසුන් ගෙන සිටි දර්ශනය දක්නට ලැබුණ. එය දැක ඔහු මලාඉකාවරයෙකුගෙන් මොවුන් කවුරුන්දැයි විමසා සිටියේය.

සිංහාසනයේ කාන්තාවන්ගේ නායිකාව වූ සෙයිද්දතුනා ෆාතිමතුස්සහ්රා رضي الله تعالى عنها තුමිය සිටින අතර අසුන් වල සෙයිද්දතුනා ආයිෂා සිද්දීකා, සෙයිද්දතුනා මර්යම්, සෙයිද්දතුනා ආසියා, සෙයිද්දතුනා රාබියා, සෙදතුනා සුබෛදා رضي الله تعالى عنهن වරුන් සිටිතියි යනුවෙන් පිළිතුරු ලැබිණ. තවත් ඉදිරියට යන විට විශාල සිංහාසනයක සර්කාරේ මදීනා රහ්මතුල් ලිල් ආලමීන් ෂෆීඋල් මුස්නිබීන්, අහ්මදල් මුජ්තබා صلى الله تعالى عليه وآله وسلم තුමාණන් තම දීප්තිමත් අලංකාර සිනහවකින් සැරසී අසුන් ගෙන සිටියහ. අසලින්ම ආසන හතරක කුලෆා උර්රාෂිදීන් වරුන් සිටි අතර දකුණු පස රන් ආසන වල නබි වරුන්ද එම්පස ෂුහදාවරුන්ද අසුන් ගෙන සිටියහ. එම අවස්ථාවේම ඔහුට ඔහුගේ පියාණන් ද එම ස්ථානයේ දක්නට ලැබුණු අතර පියාණන් තම පුතු වැළඳ ගත්තේය. ඔහු තම පියාණන් ගෙන් ඔබට මෙතරම් උසස් තත්වයක් ලැබුණේ කෙසේදැයි? විමසා සිටියේය. පිළිතුරු ලෙස මෙය මිලාද් උත්සව සැමරීම නිසා ලැබුණු ප්‍රතිඵල යැයි පියා පැවසීය. එවිටම ඔහුටද ඇහැරිණි.

පසුදින පාන්දරින්ම නැගිට තම නිවසේ ඉතිරි සියලු දේ තම පියාණන්ගේ දිර්හම් පනහද එකතු කර උලමාවරුන්,

සුලභාවරුන් ඇතුළු සියලු දෙනාට ආරාධනා කර ආහාර පාන සමඟ ඉතාමත් ඉහලින් මීලාද් උත්සවය සැමරීය. ඒ වන විටත් ඔහුට ලෞකික ආශාවන් තුරන් වී තිබිණි. ඉතිරි වූ අවුරුදු තිහක් පමණ කාලය මසිජිද් වල ගත කර වෆාත් විය. ඔහුගේ වෆාත් වලට ටික කළකට පසු කෙනෙක් සිහිනෙන් ඔහුව දැක ඔබට කුමක් වී දැයි විමසා සිටියේය. ඔහු මට මීලාද් උත්සව සැමරීමේ බරකතයෙන් ස්වර්ගයේ මාගේ පියාණන් සමඟ සිටීමේ භාග්‍ය ලැබුණා යැයි පැවසීය.

رحمة الله تعالى عليه وسلم اجمعين (තස්කිරතුල් වාඉලීන් උරුදු පිටුව 321)

"මාගේ ක්‍රියා ලේඛනය පාපයන් වලින් පිරී ඇත. එය කමා කරනු මැන මීලාදුන් නබී නම් සාගරයේ පිහිටෙන්."

## මීලාද් උත්සව සැමරීමේ සවාබ්

ශෙයික් අබ්දුල් හක් මුහද්දිස් දහ්ලවී عليه رحمة الله القوى තුමාණන් පවසන්නේ සර්කාරේ මදීනා صلى الله تعالى عليه وآله وسلم තුමාණන්ගේ ජන්ම දිනය වෙනුවෙන් මීලාද් උත්සව සමරන්නන්ට ලැබෙන ප්‍රතිඵලය නම් جنات النعيم වලට ඇතුළු වීමට භාග්‍ය ලැබීමයි. මුස්ලිම් වරුන් සැමදා ජන්ම දින මීලාද් උත්සව සමරති. ඒ වෙනුවෙන් සතුටු වී ප්‍රීතියෙන් ආහාර පාන බෙදා ගනිති. සදකා ඛයිරාත් කරති. තම සිත විවෘතව වියදම් කරති. එයට ලෝභකමක් නොදක්වති. එම නිසාම අල්ලාහ් عزوجل ගේ බරකතයන් පහළ වන්නේය. (මා සබත බිස්සුන්නාහ් පි 290)

# ජන්ම දිනයේ පිහිටෙන් යුදෙව්වන්ට ඊමානයේ භාග්‍ය ලැබුණි

හස්රත් සෙයිදුනා අබ්දුල් වාහිද් බින් ඉස්මායිල් رحمۃاللہ تعالی علیہ තුමාණන් පවසා සිටින්නේ මිස්ර් (ඊජිප්තුවෙ) වල අඹිකේ රසුල් (රසූල් صلی اللہ تعالی علیہ وآلہ وسلم තුමාණන්ගේ ස්නේහවන්තයෙකි.) කෙනෙක් වාසය කළේය. ඔහු සෑම වසරකම රබීයියුන් නූර් ෂරීෆයේ අල්ලාහ් عزوجل ගේ මහ්බූබ් صلی اللہ تعالی علیہ وآلہ وسلم තුමාණන් ගේ ජන්ම දිනය ඉතාමත් ඉහලින් සැමරීය. වරක් රබීයුන් නූර් ෂරීෆයේ ඔහුගේ අසල් වැසි යුදව් කාන්තාව තම සැමියා ගෙන් මෙසේ විමසා සිටියාය. අපගේ අසල් වැසි මුස්ලිම්වරයා සෑම වසරකම මෙම මාසයේ උත්සවයක් සමරන්නේ ඇයි? එවිට එම යුදෙව්වා තම බිරිඳ අමතා මෙම මාසයේ මුස්ලිම් වරු තම නබි නායක صلی اللہ تعالی علیہ وآلہ وسلم ගේ ජන්ම දින උත්සව සමරති. එසේම මෙම මාසයට මුස්ලිම්වරුන් ගරු කරති, යැයි පිළිතුරු දුන්නේය. එය අසා සිටි යුදෙව් කාන්තාව ෂා මුස්ලිම්වරුන් කොතරම් යහපත් ආකාරයට මීලාද් (තම නබිගේ උපන්දින) සමරති යැයි සතුටු වූවාය. එම යුදෙව් කාන්තාව රාත්‍රියේදී නින්දට ගිය අවස්ථාවේ සිහිනෙන් ඇයගේ වාසනාව උදා විය. එනම් සිහිනෙන් ඉතාමත් පියකරු පැහැපත් උත්තමයෙකු දුටුවාය. අසලින් සෙනග පිරී ඇත. ඇය ඉදිරියට පැමිණ කෙනෙකුගෙන් මේ උත්තමයාණන් කවුරුන්දැයි විමසා සිටියාය. මේ ඔබ ඉදිරියේ සිටින්නේ රහ්මතුල්ලිල් ආලමීන් අවසාන නබිවරයාණන් වන මුහම්දුර්ර සූලුල්ලාහ් صلی اللہ تعالی علیہ وآلہ وسلم තුමාණන් යැයි පවසා එතුමා පැමිණ

සිටින්නේ ඔබේ අසල්වැසි මුස්ලිම්වරයාගේ ජන්ම දින උත්සවය (මීලාද් උත්සවය)සැමරීමට සුභ පැතීමටත්, බරකතයන් ලබා දීමටත්, සතුට ප්‍රකාශ කිරීමටත් යැයි පැවසුවේය. එවිට ඇය නබි නායක صَلَّى اللهُ تعالٰى عليه وآله وسـلَّم තුමාණන් මාගේ කැඳවීමටත් (අඬ ගැසීමටත්) පිළිතුරු දෙන්නේද? යනුවෙන් ඇසුවාය. ඔව් ඔබට පිළිතුරු ලැබෙනු ඇත යැයි පැවසූ විගස ඇය නබි නායක صَلَّى اللهُ تعالٰى عليه وآله وسـلَّم තුමාණන්ට අඬ ගැසුවාය. (කැඳවූවාය) එතුමාණන් صَلَّى اللهُ تعالٰى عليه وآله وسلَّم ද පිළිතුරු වශයෙන් لَبَّيْكِ යැයි පැවසූහ. මෙයින් පුදුමයට පත් ඇයි මා මුස්ලිම්වරියෙකු නොවෙතත් ඔබ තුමාණන් මා හට පිළිතුරු දුන්නේ කෙසේදැයි විමසා සිටියාය. එවිට සර්කාරේ මදීනා රහ්මතුල් ලිල් ආලමීන් صَلَّى اللهُ تعالٰى عليه وآله وسـلَّم තුමාණන් මා හට අල්ලාහ් තආලා විසින් ඔබ මුස්ලිම්වරියෙක් වීම පිළිබඳ දැනුම් දී ඇතැයි පැවසූහ. එවිට ඇයගේ මුවින් ඉබේම ඔබ සත්‍ය වශයෙන්ම අල්ලාහ් عزوجلّ ගේ රසූල් වරයාණන් වන්නේයැයි කියමින් ෂහාදත් කලිමාව පාරායණා කළාය.

ඒ අතර ඇයට ඇහැරිණි. එක් සිත්ව ස්ථිර ලෙසම ඇය ඉස්ලාම් ධර්මය වැළඳ ගත් අතර තම සන්තකයේ ඇති සියලු දේ එකතු කර صَلَّى اللهُ تعالٰى عليه وآله وسـلَّم තුමාණන්ගේ ජන්ම දින මීලාද් උත්සවය සැමරීමට අදිටන් කර ගත්තාය.

පාන්දරින්ම තම චේතනාව මුදුන් පත් කර ගැනීම සඳහා නැගිට්ට අවස්ථාවේ තම ස්වාමියා ආහාර පාන සකසමින්

සිටිම දැක ඔබ මෙය කුමක් කරන්නේදැයි? විමසුවාය. ඔබ ඉස්ලාම් ධර්මය වැළඳ ගැනීමේ සතුටින් (ප්‍රීතියෙන්) මෙය කරන්නෙමි යි පිළිතුරු දුන්නේය. එය ඔබ දන්නේ කෙසේදැයි? විචාලිය. මාද රාත්‍රියේදී صَلَّى اللّٰهُ تعالٰى عليه واٰله وسلَّم තුමාණන්ගේ දෑතේ ඉස්ලාම් ධර්මය වැළඳ ගත්තෙමියි පැවසුවේය. (කස්කිරුතුල් වාඉලින් පි 598)

"නායකයාණන්ගේ සම්ප්‍රාප්තියෙන් අඳුරුයුගය නිමාවුණි, අහසත් පොළවත් සැම තැන ආලෝකයෙන් දිලිසුණි"

## මර්හබා යා මුස්තෆා යන උරුදු (අරාබි) වාක්‍යයේ ඇති අක්ෂර 12 ට සරිලන පරිදි මදනි පුෂ්පයන් 12

1. ජන්ම දින උත්සවයේ (මීලාද් උත්සව) සතුට වෙනුවෙන් මස්ජිද්, නිවෙස්, කඩවල්, වාහන, තම ප්‍රදේශය යනාදින් වල කොළ පාට කොඩි දමන්න. වැඩි වැඩියේ විදුලි ආලෝකයෙන් සරසන්න. අඩු තරමින් තම නිවසේ විදුලි බුබුළු 12කින්වත් සරසන්න. 11 වැනිදා හා 12 වැනිදා අතර රාත්‍රියේ මීලාද් මජ්ලිස් සීක්ර් මජ්ලිස්, බයාන් යනාදියෙන් සරසන්න. සුබ්හ් සාදික් වේලාවේ කොළ පාට කොඩි අතැතිව වසන්තයේ අරුණෝදය සලාතු සලාම් කියමින් පිළිගන්න හැකි නම් 12 වැනි දිනයේ උපවාස රකින්න. අප නබි නායක صَلَّى اللّٰهُ تعالٰى عليه واٰله وسـلَّم තුමාණන් සඳුදා දිනයන් වල උපවාස රකිති. ඒ පිළිබඳව හස්රත් සෙයිදු නා අබූකාතාදා رضى الله تعالى عنه තුමාණන් විමසා සිටි අවස්ථාවේ එම දිනයේ මා ඉපදුණෙමි. එදින පළමුවරට වහි පහළ විය යනුවෙන් පිළිතුරු දුන්හ. (සහීහ් මුස්ලිම්) සහීහ් බුහාරි ෂරීෆය ගැන

වැඩිදුරටත් පවසන විට හස්රත් සෙයිදුනා ඉමාම් කස්තලානි رحمة الله تعالى عليه තුමාණන් පවසන්නේ මීලාද් දිනයේ උත්සව සමරන්නන් ගැන අත්දැකීමෙන් කිව හැක්කේ එම වසර ශාන්තියෙන් සමාදානයෙන් ගෙවන අතර සියලු චේතනා ඉතා ඉක්මනින් ඉටු වන බවයි. අල්ලාහ් عزوجل මීලාද් ජන්ම දින රාත්‍රිය උත්සවශ්‍රියෙන් සමරන්නාට කරුණාව දයාව දක්වත්වා! (මවාහිබුල්ලදුන්නිය පි 1 පිටු 27 මිස්ර්)

2. කඃබාවේ රූපය වටා පුංචි පුංචි බෝනික්කන් තවාෆ් කරන ආකාරයේ සැරසිලි කිරීම හරාම් වන්නේය. මක්කා ජයග්‍රහණය කළ අවස්ථාවේ කඃබාවේ තිබූ පිළිමයන් සියල්ල ඉවත් කරන ලදී. එම නිසා එසේ කිරීමෙන් වළකින්න.

3. ගේට්ටුවල සතුන්ගේ රූප සිතුවම් කිරීම, ඇලවීම යනාදියත් තහනම්ය. එසේ සතුන්ගේ රූප සහිත නිවසට මලාඉකාවරුන් ඇතුළු නොවන්නේය. එසේ සත්ව රූප වලට පණ දීමට සිදුවන්නේය. නැතහොත් එතෙකල් දඬුවම් විඳිමට සිදුවෙයි.

4. සමහර අවස්ථාවන් වල මීලාද් උත්සව සැමරීමට ඉස්ලාමයේ තහනම් කළ බෙර යනාදිය පරිහරණය කරති. නමුත් صلى الله تعالى عليه وآله وسلم තුමාණන් පවසා සිටින්නේ මා හට බෙර යනාදිය කඩා දැමීමට අණ කර ඇති බවයි.

හස්රත් ලහ්හාක් رحمة الله تعالى عليه තුමාණන් රිවායත් කරන්නේ ගීත ගැයීම සිත දැඩි කරන අතර අල්ලාහ් තආලාව කෝප කරවන බවයි. (තෆ්සීර් අහ්මදියියා)

5. කසිදා කැසට් අසන්න. ශ්‍රවණ කිරීමට අවසර ඇතත් එයින් අසාන්, රෝගීන්ට බාධා ඇති නොවීමට වග බලා ගන්න.

6. ප්‍රසිද්ධ මාර්ගයේ මගීන්ට, වාහන වලට අවහිර වන ආකාරයට කොඩි සිටවීම, සැරසිලි කිරීම තහනම්ය.

7. ස්ත්‍රීන්ට ෂරීඅතයේ අවසරයකින් තොරව නිවසින් පිටවීම හරාම්ය. එම නිසා සැරසිලි දැකීමට යැමට අවසර නැත. එසේම විදුලිය සොරෙන් භාවිතා කිරීමත් තහනම්ය. එම නිසා ඒ පිළිබඳවත් අවධානය යොමු කරන්න.

8. ජුලූස් (පෙළපාලියක)දී වුළු සමඟ සිටීමට උත්සාහ කරන්න. සලාතය ජමාඅතය සමඟ ඉටු කිරීමට වග බලා ගන්න.

9. ජුලූස් (පෙළපාලි) වලදී සත්වයන් රැගෙන යෑමෙන් වළකින්න. එයත් මගීන්ට අපහසුතාවයක් විය හැක.

10. ජුලූස් (පෙළපාලියෝ)දී පළතුරු ආහාර පාන විසිකිරීමෙන් වළකින්න. හැකි පමණින් අතටම දීමට උත්සාහ කරන්න. (එසේ විසි කිරීමෙන් කකුල් වලට පෑගීමට ඉඩ ඇත.)

11. ජුලූස් (පෙළපාලි)යේදී ප්‍රශ්නකාරී ශබ්ධ කිරීමෙන් වලකින්න. එසේ නොකර සිටීම සියලු දෙනාටම යහපතකි.

12. ජුලූස් (පෙළපාලි)යට වටින් පිටින් ගල් මුල් ප්‍රහාර සිදු වුවහොත් කේන්ති නොගෙන ඉවසිල්ලෙන් සිටින්න.

"කුඩා මල් කැකුළ සුවඳවත් කරමින් වසන්තයේ අරුණෝදය උදකරමින් ජන්ම දිනය පැමිණයේ"

## ජන්ම දින උත්සව සැමරීමේ ක්‍රම

(අමීරේ අහ්ලුස්සුන්නත් دامت بركاتهم العاليه විසින් රචිත

මෙම පොත මුස්ලිම්වරුන් සියලූ දෙනාට ඉතාමත් ප්‍රයෝජනවත්ය. දඃවතේ ඉස්ලාමී ප්‍රධාන මජ්ලිසේ ෂූරාවෙන් ඉල්ලීමක් නම් සැම දෙනාම සෆරුල් මුලෆ්ෆර් මාසයේ අවසන් සතියේ ඉජ්තිමාවල මතක් කිරීම සඳහා මෙය කියවන්න. ඉස්ලාමිය සහෝදර සහෝදරියන් තම තමන්ගේ රට වලට උචිත අන්දමින් සමරන්න.)

بِسْمِ اللهِ الرَّحْمٰنِ الرَّحِيْمِ

සගේ මදිනා (මදිනාවේ සේවක) මුහම්මද් ඉල්යාස් අත්තාර් කාදිරී රzසවී عَفِيَ عَنْهُ වෙතින් සියලූ ඉස්ලාමීය සහෝදර/සහෝදරියන්ට ජෂ්නේ විලාදත් (ජන්මදින සැමරුම) වෙනුවෙන් හද පිරී සතුටින් කොළ පාට කොඩි හා දිලිසෙන ආලෝකයෙන් කුංකුමන් සුවඳ විඳගෙන පැණිම පැණි වාගේ රසයෙන් යුතු මදනි සලාම්

اَلسَّلَامُ عَلَيْكُمْ وَرَحْمَةُ اللهِ وَبَرَكَاتُهُ اَلْحَمْدُ لِلّٰهِ رَبِّ الْعٰلَمِيْنَ عَلٰى كُلِّ حَالٍ

"ඔහු ගැන ප්‍රචාරය ඔබත් කර ඔබ සිත දිලිසා ගන්න. උසස්ම උසස් නබීගේ කොඩිය සැම නිවෙසම ලෙලදෙන්න."

1. සඳ දැකීමෙන් පසු මස්ජිද්වල තුන්වරක් මෙසේ දැනුම් දෙන්න. ඉස්ලාමීය සහෝදරවරුණි! සහෝදරියණි! ඔබ සැමට සුභ පතමු රබීයියුන්නූ ෂරීෆයට සඳ දක්නට ලැබුණි!

“රබීයියුන් නූර් බලාපොරොත්තු රැගෙන පැමිණියා.
ප්‍රාර්ථනාවන් දැතින් රැගෙන පැමිණායා.”

2. පිරිමින් රැවුල බෑම හා එක් මිටක් ප්‍රමාණයට අඩුවෙන් තැබීමත් හරාම් වන්නේය. ඉස්ලාමීය සහෝදරියන් ෂරීඅතයට අනුව ශරීරය නොවසා සිටීමත් හරාම් වන්නේය. අඩු තරමින් රබීයියුන් නූර් මාසයේ පළමු දිනය සිට 12 වැනි දින දක්වා රැවුල බෑම හා සහෝදරියන් ෂරීඅතයට පටහැනි ඇඳුම් පැළඳුම් වලින් වැලකී සිටින්න.

“ඔහුගේ පැමිණීමට සලිත වී සිරස නැමුවිට කඃබාවේ තිබූ පිළිමයන් ඇද වැටුණා අහ්ලන් වසහ්ලන් මර්හබා ”

3. සුන්නතයන් හා යහ ක්‍රියාවන් වල යෙදී සිටීමට හොඳම ක්‍රමය නම් මදනි ඉනාමාත් කාඩ් පත සියලු ඉස්ලාමීය සහෝදර /සහෝදරියන්ම නොවරදවා පුරවා සැම මාසයටම භාර දෙන්න. අත ඔසවා إن شاء الله عز وجل කියන්න.

“රහ්මතයේ වලාකුලින් රහ්මතයේ පොද වැටුණි
ෂාහේ අරබිගේ සම්ප්‍රාප්තියෙන් සියලු සිතුවිලි ඉටුවුණි.”

4. සියලු ඉස්ලාමීය සහෝදර / සහෝදරියන් නිගරාන් / බලධාරීන්ගේ සහභාගිත්වයෙන් රබීයි යුන්නූර් ෂරීෆයේ

(මාසයේ) විශේෂයෙන් අඩු කරමින් දවස් තුනක මදනි කාෆිලා වල ගමන් කරන්න. ඉස්ලාමීය සහෝදරියන් සැමදා දවස් 30ම නිවෙසියන්ට ෆයිසානේ සුන්නත් වලින් දර්ස් (පාඩම්) දෙන්න. ඉන් පසුද දිගටම එසේ කිරීමට නියියත් කර ගන්න.

"රහ්මතයන් රැස්කරන්න කාෆිලාවේ ගමන් ගන්න.
සුන්නතයන් ඉගෙන ගන්න කාෆිලාවේ ගමන් ගන්න."

5. තම මස්ජිදයේ, නිවසේ, කඩයේ, වැඩපොළේ කොළ පාට කොඩි 12 ක් ඔසවන්න. අඩු තරමින් එකක්වත් ඔසවන්න. වාහන වලද තම වියදමින් කොඩියක් ගැට ගසා ගන්න. එසේ කිරීමෙන් සැම පැත්තෙන්ම කොළ කොඩි (ධජයන්) ලෙලදෙනවා දැකිය හැකිය. එසේම වාහන වල පේළි තුනකට

"بسم الله الرحمن الرحيم الصلاة والسلام عليك يارسول الله"

"මා දැවතේ ඉස්ලාමීය ප්‍රිය කරමි!" ලිවීමට අයිතිකරුවන් උනන්දු කරවා සගේ මදීනා (මදීනාවේ සේවක)ගේ දුආ ප්‍රාර්ථනා ලබා ගන්න.
අත්‍යාවශ්‍ය උපදෙසක් :- කොඩියේ යම් කිසි දෙයක් ලියා ඇත්නම්, එහි පාවහන් යුගලේ රූපය තිබුණා නම් එය සුළඟට ලෙලදෙමින් බිමට පතිත නොවීමට වග බලා ගන්න. එසේ කළ නොහැකි නම් කොළ පාට කොඩියක් පමණක් ලෙලවන්න. (සගේ මදීනා තම නිවසේත් වැඩි ආරක්ෂාවට තනි කොළ පාට කොඩියක් පමණක් ලෙලවන්නේය.)

"නබිගේ කොඩිය රැගෙන පිටවී ලොවට පතුරුවමු
සාමයේ කොඩිය නබිගේ කොඩියයි සැම නිවෙසම
ලෙලදෙමු"

6. තම නිවසේත් තම ප්‍රදේශයේ මස්ජිදයේත් අඩු තරමින් අලංකාර විදුලි බුබුළු දවස් 12 ක් වත් දල්වන්න. හැකි පමණින් සරසන්න. (නමුත් විදුලිය සොරකම් කිරීමෙන් වලකින්න.) සෑම පැත්තෙන්ම කොළ කොඩි වලින් හා විදුලි ආලෝකයෙන් සරසන්න. (නමුත් මාර්ගයේ ගමන් කරන වාහන, මගීන්ට අවහිර නොවන ලෙස)

"මස්ජිද් අක්සා කෑබා වහලේ ආමිනාගේ නිවෙසේ සිටවන ලද්දේ කොඩියන් අහ්ලන් වසහ්ලන් මර්හබා"

7. පළමු සඳ දැකීමේ සිට 12 වැනි රාත්‍රිය දක්වා මදනි ළදරුවන් කොළ කොඩි අතැතිව කොළ තළප්පාවක් හා මදනි ඇඳුමෙන් සරසා මර්හබා ශබ්දය සමඟ සෑමදා මැරිබ් හා ඉෂා වල අතර තුර මදනි ජුලූස් (පෙළපාලි) පිටත් කරන්න.

8. සගේ මදීනා විසින් රචිත "ජෂ්නේ විලාදත්" (ජන්ම දින උත්සව)ය අත් පත්‍රිකා 112 ක් හෝ 12 ක් හැකිනම් වසන්තයේ අර්ණෝදය නැමැති පොත් 12 ක් මක්තබතුල් මදීනාවෙන් මිළදී ගෙන බෙදා දෙන්න. විශේෂයෙන් මිලාද් සමරන්නන්ගේ නායකයන් අතට පත් කරන්න. රබියියුන් නූර් මාසයේ 1200/=ක් නැත්නම් 112/=ක් එසේත් නැත්නම් 12/=ක් යම් කිසි සුන්නි ආලිම්වරයෙකුට තෑගි කරන්න. ඒ සමඟ සෑම මාසයේම එසේ කිරීමට නියියත් කර ගන්න එය සිකුරාදා දිනයන් වල දීම ඉතාමත් ශ්‍රේෂ්ඨයි. එදිනට 70 ගුණයක් වැඩියෙන් පින් ලැබෙන්නේය. හැකි නම් සුන්නතයන් වලින් පිරිණු බයාන් කැසට් පට 12 ක් මිළදී ගෙන බෙදා දෙන්න. ඊද් කාඩ් බෙදා දීමේ වෙනුවට මෙසේ ප්‍රයෝජනවත් දෙයක් දීම

වඩාත් යෝග්‍ය ක්‍රියාවක්. එම කාඩ්වල ගල්වා ඇති දිලිසෙන කුඩු වර්ග අත් පා වල තැවරීමෙන් වුළු කිරීම සලාතය ඉටු කිරීම යනාදියේදී ප්‍රශ්න ඇති කරන බවද අමතක නොකරන්න.

9. විශාල නගරයන් වල බලධාරීන් තම මුළු ප්‍රදේශයම ආවරණය වන පරිදි දවස් 12ක්ම ඉපිතිමා පැවැත් වීමට සැලසුම් සකස් කරන්න. (ඉස්ලාමීය සහෝදරියන් තම නිවසේ) රබීයියුන් නූර් මාසයේ සිදුවන සියලු ඉපිතිමාවල කොළ පාට ඉමාමා (තලප්පාව) සමඟ සහභාගි වන්න හැකිනම් කොළ කොඩියක් ද රැගෙන යන්න.

"දෑතේ කොඩියන් මුවින් කසීද කොතරම් ලස්සන සර්කාර්ගේ අනුගාමිකයන්"

10. එකොළොස් වැනිදා සවස 12 වැනි රාත්‍රියේ ස්නානය කර හැකි තරමින් අවුරුදු වලටත් අවුරුද්දක් වූ දිනය පිළි ගැනීමට අලුත්ම අලුත් ඇඳුම් පැළඳුම් වලින් සැරසී සුවඳ විලවුන් ගා අත්‍යාවශ්‍ය සියලු දේ අලුතින් ගෙන සැරසෙන්න. (ඉස්ලාමීය සහෝදරියන්ද තමන්ට අවශ්‍ය දේ අරගන්න)

"නව පාලනයක් පැමිණි විට නව නිති පැනවේ
ලොවටම වෙනසක් කළේ ජන්ම දින රාත්‍රියයි."

11. දොළොස් වැනි රාත්‍රිය ඉප්තිමා, සික්ර්, කසීදා සමඟ ගත කර සුබ්හ් සාදික් වන විට තම දෑතේ කොළ කොඩි රැගෙන සලාතු සලාම් සමඟ වසන්තයේ අර්ණෝදය පිළිගන්න. සුබ්හ් සලාතයට පසු සලාම් හා සුබ පැතුම් කියමින් සියලු දෙනාම සුභ පතා ගන්න.

“අවුරුදු වලටත් අවුරුදු මීලාදුන් නබි උත්සවයයි
අද දිනයයි අවුරුදු මීලාදුන් නබි උත්සවයයි.”

12. අපගේ ආදරණීය නායක صَلَّى اللّٰهُ تعالٰى عليه واٰله وسـلَّم තුමාණන් සෑම සඳුදාවකම තම උපන් දිනය සමරමින් උපවාසය රැකිය. එය අනුගමනය කරමින් ඔබත් එතුමාණන්ගේ ජන්ම දිනයේ උපවාසය රකිමින් දෑතින් කොළ කොඩි රැගෙන මදනි ජුලූස් වල වුළු සමඟ ගමන් කරන්න. කසීදා කියමින්, සලවාතය උසුලමින් තම බැල්ම පහතට හෙළා ගාම්භීර අන්දමින් ජුලූස් (පෙළපාලි)යේ ගමන් කරන්න.

“රබීඋල් අව්වල් ඔබසතු නොවන්නේ කෙසේද අහලූස්සුන්නත්?
ඔබේ 12 වැනි දිනයේ ප්‍රාණය ඇති එම සඳ එළි දුටුවා නම්.”

## සවාබුල් ජාරියා (සදකතුල්ජාරියා)
## (දිගටම ලැබෙන කුසල්)

මෙම පොත් පිංච කියවීමෙන් පසු අනුන්ටත් දී උදව් වෙන්න. තවද මීලාද් උත්සව වලත්, අව්ලියාවරුන්ගේ දානයන් (කන්දූරි) වලත්, මංගල්‍යය උත්සව වලදීත්, කතමුල් කුර්ආන් තමාම් කරන අවස්ථාවලත්, තවද ආගමික උත්සව වලදීත්, මළවුන්ට පින් ලබාදීම පිණිසත්, තවද අමාරු දුෂ්කර අවස්ථාවලින් මිදීමත් මෙම පොත මක්තබතුල් මදීනාවෙන් මිළදීගෙන අධික ලෙස පින් (කුසල්) ලබා ගන්න.

මෙම පොත භාෂා ගණනාවකින් **www.dawateislami.net** වෙබ් අඩවියේ පළ කර ඇති අතර අවශ්‍ය භාෂාවකින් කියවීමට ඒ වෙත යොමුවන්න.

قفل مدینہ ۷۸۶ ۹۲

الصلوۃ والسلام علیک یارسول اللہ

# සුන්නතයන් හි වසන්තයන්

අල්හම්දුලිල්ලාහ් عَزَّوَجَلَّ අල්කුර්ආනය හා සුන්නතයන් උගන්වන අහ්ලුස් සුන්නත්වල් ජමාඅතයේ දේශපාලනයෙන් තොර ලෝක සංවිධානයක් වන දා'වතේ ඉස්ලාමියේ සුවඳවත් මදනි වට පිටාව තුල වැඩි වශයෙන් සුන්නතයන් ඉගෙනීමටත් ඉගැන්වීමත් සිදු කරනු ලැබේ. සෑම බ්‍රහස්පතින්දා සවස මැරිබ් සලාතයේ සිට නො. 10 මැසෙන්ජර් වීදියේ කොළඹ 12 යන ලිපිනයේ සිදු වන සුන්නත් වලින් පිරුණු ඉජ්තිමාවේ ආරම්භයේ සිට අවසානය දක්වා සහභාගි වී වැඩ වැඩියෙන් පින් (කුසල්) රැස්කර ගන්න.

තවද රසූල් صلی اللہ تعالی علیہ وسلم තුමානන් ගේ ස්නේහවන්තයන් සමග සුන්නතයන් ඉගෙන ගැනීමට මදනි කාෆිලාවල ගමන් කරන්න. ඔබ ශීලාචාර මුස්ලිම්වරු (හොඳ පුරවැසියන්) වීමට මක්තබතුල් මදීනා එනම් දා'වතේ ඉස්ලාමී පොත් හලකින් මදනි ඉන් ආ මාත් කාඩ් පතක් සෑම ඉස්ලාමී මාස ආරම්භයේදීම ලබාගෙන එහි ඇති පරිදි ක්‍රියා කර (අමල් කර) දිනපතා ෆික්රේ මදීනා (තම ක්‍රියාවන් අධීක්ෂණ) කරමින් එය පුරවා සෑම ඉස්ලාමීය මාසයේ අවසානයේදී ඔබේ ප්‍රදේශයේ දා'වතේ ඉස්ලාමී බලධාරියාට එය භාර දෙන්න. ඉන්ශා අල්ලාහ් عَزَّوَجَلَّ මෙහි බරකතයෙන් ෆර්ල් වාජිබ් හා සුන්නතයන් නිසියාකාරව පිළිපැදීමටත් පාප ක්‍රියාවන් වලින් ඈත් වී ඊමානය ආරක්ෂා කර ස්ථිර තත්වයකට පැමිනීමෙන් දැකිය හැක.

සෑම ඉස්ලාමීය සහෝදරවරුන් තම තමාවත් සියලු ලෝවැසියන් යහමගට ගැනීමට උත්සාහ දරමි (කරමි) ඉන්ශා අල්ලාහ් عَزَّوَجَلَّ යන මදනි (යහ) අරමුණ (මතය) තම අරමුණ කර ගත යුතුයි. තමන් ශීලාචාර (යහමගට පැමිනීම) වීමට මදනි ඉන්ආමාත් අනුව ක්‍රියා (අමල්) කරන අතර ලෝ වැසියන් (ලෝකයේ ජනතාව) ශීලාචාර කිරීමට මදනි කාෆිලාවේ ගමන් කිරීමෙන් ඉහත සඳහන් මදනි අරමුණ ඉටුකර ගත හැකිය.

مکتبۃ المدینہ